**මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතිය - 2022**

**----------------------------------------------------------------**

මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2010 මාර්තු 26 දින එළඹි අංක එස්එල්-පී 99 දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහනුවර නගරයේ අපජලය රැස් කිරීම, පිරිපහදු කිරීම හා බැහැර කිරීම සඳහා යෝග්‍ය ක්‍රමවේදයක් ගොඩනැංවීම මඟින් ජනාකීර්ණ ප්‍රදේශ වල සනීපාරක්ෂක පහසුකම් යළි නගා සිටුවීම, මහවැලි ගඟේ ජලයේ ගුණාත්වය හා ජීවන පරිසරය උසස් කිරීම හා ඒ අනුව ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය, සෞඛ්‍ය හා සුබ සාධනය ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 21,982 කට සමාන ජපන් යෙන් මිලියන 17,278 ක් වන අතර, ඉන් රු.මිලියන 17,922 කට සමාන ජපන් යෙන් මිලියන 14,087 ක් සැපයීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය එකඟ වී තිබුණ අතර ඉතිරි මුදල වූ රු.මිලියන 4,060 කට සමාන ජපන් යෙන් මිලියන 3,191 ක් ශ්‍රී ලංකා රජය විසින් සැපයීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 පෙබරවාරි 03 දින ආරම්භ කර තිබුණු අතර 2017 සැප්තැම්බර් වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාලය 2022 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

### 1.3 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 02 වගුවේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු / විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 අනුව 2010 වර්ෂයේ සිට ව්‍යාපෘතියේ සේවය කරන සේවකයන් 17 දෙනෙකු සඳහා රුපියල් මිලියන 3.5 ක්වූ පාරිතෝෂිත වෙන්කිරීම් සිදු කර නොතිබුණි. | ව්‍යාපෘති කාර්ය මණ්ඩලය පත් කිරීම, වැටුප් සකස් කිරීම සහ ගෙවීම ප්‍රධාන කාර්යාලය විසින් සිදු කරනු ලබන අතර මෙම පාරිතෝෂිත ප්‍රතිපාදන ද ප්‍රධාන කාර්යාලය විසින් සිදු කළ යුතුය. | ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 07 වැනි ඡේදයට පටහැනිව මුළු මුදල රුපියල් මිලියන 6.3 ක වටිනාකමකින් යුත් කාර්යාල උපකරණ සහ පරිගණක ද්‍රව්‍ය කෙරීගෙන යන වැඩ ගිණුම යටතේ ගිණුම්ගත කර තිබුණි. | අපි එම වත්කම් කෙරීගෙන යන වැඩ ගිණුමෙන් ඉවත් කර විගණන පැහැදිලි කිරීම්වලට අනුව ජංගම නොවන වත්කම් යටතේ පෙන්වන්නෙමු. | ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කොන්ත්‍රාත්කරුවෙකු විසින් සපයා තිබූ රු. මිලියන 16 ක් වටිනා ට්‍රක් රථයක් 2022 ජූලි මාසයේ සිට මහනුවර මහ නගර සභාව විසින් ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු සඳහා භාවිතා කර තිබූ නමුත් එම ට්‍රක් රථය මෝටර් වාහන යටතේ ගිණුම්ගත කර නොතිබුණි. ඒ අනුව 2022 දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම්වල වටිනාකම සහ උපචිත වියදම් වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | කොන්ත්‍රාත්කරු වෙත සම්පූර්ණ ගෙවීම මුදා හැරීමෙන් පසු, WP DAH-8099 වාහනය වත්කම ලෙස ව්‍යාපෘතිය විසින් ගිණුම්ගත කරනු ඇත. | අදාළ ලෙජර ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ඈ) | ඉඩම් දෙකක් මිලදී ගැනීම සඳහා ගෙවා තිබූ රුපියල් මිලියන 1.1 ක ගෙවීමක් ගිණුම්ගත කර නොතිබූ අතර ඒ අනුව ජංගම නොවන වත්කම් ශේෂය එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි. | ව්‍යාපෘතියට අදාළ සියලුම ඉඩම් සම්බන්ධ වියදම් අදාළ ඒකකවලින් ලබාගෙන ඒවා ප්‍රාග්ධනීකරණය කරන බව ඔබට දන්වා සිටීමට කැමැත්තෙමු. | මෙම ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ඉ) | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ව්‍යාපෘතිය යටතේ අපජල පොම්පාගාරයක් ඉදිකිරීම සඳහා ඉඩමක් අත්පත් කර ගැනීම සඳහා ගඟවට කෝරළයේ ප්‍රාදේශීය ලේකම්වරයාට රුපියල් මිලියනයක මුදලක් ලබාදී ඇති අතර එම මුදල ඉඩම් ගිණුමට භර කර නොතිබුණි. ඒ අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ඉඩම්වල වටිනාකම එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි. | ව්‍යාපෘතියට අදාළ සියලුම ඉඩම් සම්බන්ධ වියදම් අදාළ ඒකකවලින් ලබාගෙන ඒවා ප්‍රාග්ධනීකරණය කරන බව ඔබට දන්වා සිටීමට කැමැත්තෙමු. | ඉඩම විධිමත් ආකාරයෙන් පවරාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2014 ජනවාරි 17 දිනැති අංක FP/06/20/03/119 ලිපියට අනුව ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් ද්‍රව්‍ය, වැට් බදු සහ රේගු බදු වලින් නිදහස් කර ඇත. කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් 31 දිනට මිලදී ගත් ද්‍රව්‍ය සඳහා නිදහස් කළ වැට් බද්ද සහ රේගු බදු මුදල රුපියල් මිලියන 1,418.2 ක් කෙරීගෙන යන වැඩ ගිණුමේ සහ භාණ්ඩාගාර ප්‍රධාන (GOSL) ගිණුමේ සටහන් කර ඇත. ඒ අනුව, කෙරීගෙන යන වැඩ ගිණුමේ වටිනාකම සහ භාණ්ඩාගාර ප්‍රධාන (GOSL) ගිණුමේ වටිනාකම එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම නිදහස් කළ වැට් බදු සහ රේගු බදු පිරිවැය ව්‍යාපෘතියේ වියදමක් ලෙස හඳුනාගනිමින් ණය සහ ප්‍රදාන ගිණුමට (දේශීය) ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලබයි. | දැනට පවතින ගිණුම් දෝෂය නිවැරදි කළ යුතුය |

## 2.2 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති රීති සහ රෙගුලාසිවෙත යොමුව | අනුකූල නොවීම / විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|
| කළමනාකරණ විගණන චක්‍රලේඛය 02/2016 | චක්‍රලේඛයේ සඳහන් උපදෙස් අනුව ව්‍යාපෘතිය ආරම්භයේ සිට 2022 දෙසැම්බර් 31 දක්වා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ව්‍යාපෘතිය දැනටමත් ප්‍රධාන කාර්යාලයට දන්වා ඇත. | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අඛණ්ඩ අභ්‍යන්තර පරීක්ෂණ පැවැත්විය යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| | ව්‍යාපෘති ක්‍රියාකාරකම | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | පැකේජය 1 - අපජල පවිත්‍රාගාරය | ගිවිසුමට අනුව, උපකරණවල වගකීම් කාලය 2025 ජූලි දක්වා ලබා දී ඇත, කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරු ගිවිසුමට අනුව සිදු කළ යුතු කටයුතු 2022 දෙසැම්බර් 31 වන විට නතර කර ඇත. ඊට අමතරව, කොන්ත්‍රාත්කරු හඳුනාගත් අඩුපාඩු 26 ක් නිවැරදි කිරීමට කටයුතු කර නොමැත. උපකරණවල හඳුනාගත් දෝෂ සහ ඉහත ගිවිසුමට අනුව මේ සම්බන්ධයෙන් ව්‍යාපෘතිය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හඳුනාගත් දෝෂ මත පදනම්ව, වගකීම් ගිවිසුමට අනුව අදාළ ඇස්තමේන්තුගත පිරිවැය ආවරණය කරගැනීම වෙනුවෙන් ලබාගෙන ඇති සුරක්ෂණය මුදල් කර ගැනීම සඳහා බැංකුව වෙත ඉල්ලීම් ලිපි යවනු ලැබේ. | ස්ථාපිත උපකාරණවල ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් අඛණ්ඩ අභ්‍යන්තර පරීක්ෂණයක් පැවැත්විය යුතු අතර හානි අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | පැකේජය 3- දේපල සම්බන්ධතා | ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව කොන්ත්‍රාත්තුව 2021 ජූලි මාසයේදී අවසන් කළ යුතු නමුත් එය සැලසුම් කළ පරිදි අවසන් කර නොතිබූ අතර එය 2022 ඔක්තෝබර් 21 දින අත්හිටුවන ලදී. ගෘහස්ත සහ ගෘහස්ථ නොවන මලාපවහන සම්බන්ධතා 9,502 ක් ප්‍රධාන මලාපවහන ජාලයට සම්බන්ධ කිරීමට සැලසුම් කර ඇතත්, 2022 දෙසැම්බර් 31 වන දින සම්බන්ධතා 6,063 ක් පමණක් ඉදිකර ඇති අතර ප්‍රධාන මලාපවහන ජාලයට සම්බන්ධතා 3,769 ක් සම්බන්ධ කර ඇත. | ප්‍රගති ගෙවීම පැහැර හැරීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් ප්‍රගතියකින් තොරව එම මූලික කටයුතු පවත්වාගෙන යන බැවින් අමතර පිරිවැය අඩු කිරීම සඳහා අත්හිටුවීම නිකුත් කරන ලදී. | ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
| --- | --- | --- |
| ෆිඩික් (FIDIC) මාර්ගෝපදේශ ඡේද අංක 14.7 හි සඳහන් විධිවිධානවලට අනුව, සහතික කළ අතරමැදි ගෙවීම් පියවීම බිල්පත් ලැබුණු දින සිට දින 56 ක් ඇතුළත සිදු කළ යුතුය. නමුත් මාර්ගෝපදේශයට අනුව නියමිත දින ඉක්මවා පසුගිය වසරවලට අදාළව රුපියල් මිලියන 97 ක වටිනාකමකින් යුත් බිල්පත් පහක් සහ සමාලෝචිත වර්ෂයට අදාළව රුපියල් මිලියන 284 ක වටිනාකමකින් යුත් බිල්පත් 15 ක් පියවීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව ගෙවීම් ප්‍රමාදවීමේ බරපතල අවදානමක් පවතින බව නිරීක්ෂණය විය. | අයවැය අනුමත කිරීමේ ප්‍රමාදය හේතුවෙන් ගෙවීම් ප්‍රමාද වූ අතර ණය ආපසු ගෙවීම පැහැර හරින බවට ශ්‍රී ලංකා රජය දැනුම් දීම නිසා ජයිකා **(JICA)** ආයතනය විසින් මුදල් ලබා දීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් පසුව ගෙවීම් ප්‍රමාද විය. | හිඟ බිල්පත් ප්‍රමාදයකින් තොරව පියවීමට කටයුතු කළ යුතුයි. |

## 3.3 බාහිර ක්‍රියාකාරකම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| (අ) | 2022 වර්ෂයට අදාල වාර්ෂික සමීක්ෂණ වාර්තාවට අනුව, මුළු මුදල රුපියල් මිලියන 5 ක් වටිනා පරිගණක සහ කාර්යාල උපකරණ භෞතිකව නොතිබුණි. කෙසේ වෙතත් මුදල් රෙගුලාසිවලට ප්‍රකාරව මේ සම්බන්ධයෙන් පියවර ගෙන නොතිබුණි. | **2022.12.31** දිනට පසු, උපදේශක කාර්ය මණ්ඩලය විසින් භාවිතා කරන ලද මෙම අයිතමයන් මහනුවර මහ නගර සභා ගොඩනැගිල්ලේ ඇති බවට ව්‍යාපෘතිය මගින් මහනුවර මහ නගර සභාව සමඟ සත්‍යාපනය කර තහවුරු කර ඇත. | සත්‍යාපන වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | රුපියල් මිලියන 323 ක වටිනාකමකින් යුත් වාහන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට භාරදී ඇති බව තහවුරු කිරීමේ වාර්තා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණන කටයුතු අවසන් කිරීමට නොහැකි විය. | ඒ අනුව යාන්ත්‍රික හා විදුලි සහකාර සාමාන්‍යාධිකාරී **(DGM (M&E))** වෙත මේ බව දන්වා ඇත. | තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 මතභේදයට තුඩුදෙන කරුණු

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| (අ) | විගණනයට ඉදිරිපත් කර ඇති තොරතුරුවලට අනුව, ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලි  කටයුතු ආරම්භ කර 2023 ජුනි 09 වැනි දින විගණන දිනට වසර 20 ක් ගත වී ඇතත් ව්‍යාපෘති කටයුතු සඳහා භාවිත කර තිබූ ඉඩම් 09 න් ඉඩම් 02 ක් පමණක් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් කර තිබුණි. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ **(NWSDB)** ඉඩම් අංශය මගින් එවන ලද පිළිතුර මේ සමඟ අමුණා ඇත. | **ඉඩම් අත්පත් කර ගැනීම ප්‍රමාදයකින් තොරව අවසන් කිරීමට කටයුතු කළ යුතුයි.** |

| | | | |
|---|---|---|---|
| (ආ) | අංක LAND/CE/KAN/GEN/3833 සහ 2023 ජූනි 09 දිනැති වරිපනම් ලිපියට අනුව ව්‍යාපෘතියට අදාළ ප්‍රධාන පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ වන්දි වශයෙන් රුපියල් මිලියන 3 ක් ගෙවීමට තීරණය කර තිබියදී පසුව ඉඩම් හිමියා විසින් තක්සේරු වටිනාකම ප්‍රමාණවත් නොවන බවට වන්දි සමාලෝචන මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත් අවසන් තීරණය 2023 ජූනි 07 වන විට ලැබී නොතිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීම සහ ප්‍රධාන පොම්පාගාරය දැනටමත් ඉදිකර ඇති අතර එය මෙහෙයුම් තත්ත්වය යටතේ පවතී. වැඩි වන්දි මුදලක් ඉල්ලා සිටින බැවින් ඉඩම් හිමියාගේ අභියාචනය පමණක් විසඳනු ලැබේ. | **ඉඩම් අත්පත් කර ගැනීම ප්‍රමාදයකින් තොරව අවසන් කිරීමට කටයුතු කළ යුතුයි.** |